21. සෛල වලින් සැදුම් ලත් ජෛව පදාර්ථයක් අපරිමිත දාම් පුවරුවකින් නිරූපණය කර ඇත්තේ එක් කොටුවකින් එක් සෛලයක් දැක්වෙමිනි. සෛලයක් එක්කෝ ජීවී නැත්නම් අජීවී වෙයි. පුවරුවෙහි ඇති සියලු ම සෛල පහත නියම වලට අනුකූල ව එකවිට සිය ජීවී අජීවී බව වෙනස් කර ගනිමින් මීලඟ පරපුර උත්පාදනය කරයි.

(i) ජීවී සෛලයක අසල්වැසි සෛල 8 න් හරියටම 2 ක් හෝ 3 ක් මෙම පරපුරෙහි ජීවී ව පවති නම්, එම සෛලය මීලඟ පරපුරෙහි ද ජීවී ව පවතී. එසේ නොවුවහොත් එය මීලඟ පරපුරෙහි දී අජීවී වෙයි.

(ii) අජීවී සෛලයක අසල්වැසි සෛල 8 න් හරියටම 3 ක් මෙම පරපුරෙහි ජීවී ව පවති නම්, එම සෛලය මීලඟ පරපුරෙහි දී ජීවී බවට පත් වෙයි. එසේ නොවුවහොත් එය මීලඟ පරපුරෙහි දී අජීවීව ම පවතී.

ශූන්‍ය පරපුර පහත දක්වා ඇති ජෛව පදාර්ථයෙහි 2009 වැනි පරපුර කුමක් ද? මෙහි ජීවී සෛල අඳුරු කර ඇති අතර අඳුරු නොකර ඇත්තේ අජීවී සෛල ය.



(A)  (B)  (C)  (D)  (E) 

22. කොළ පැහැති පබළු 6 කින් සහ නිල් පැහැති පබළු 6 කින් පබළු 6 ක් තෝරාගෙන වෘත්තාකාර වළල්ලක් සෑදිය හැකි ආකාර කියක් තිබේ ද?

(A) 7 (B) 8 (C) 12 (D) 13 (E) 14

23. සේප්පුවක් සඳහා වූ සංඛ්‍යාංක 5කින් යුක්ත රහස් අංකය අවසන් වන්නේ ඉරට්ටේ සංඛ්‍යාංකයකින් බවත්, එහි හරියටම එක් ඔත්තේ සංඛ්‍යාංකයක් පමණක් ඇති බවත්, හරියටම සංඛ්‍යාංක දෙකක් පමණක් එකිනෙකට සමාන වන බවත් සොර මුලක් විසින් අනාවරණය කොට ගෙන ඇත. ඔවුන් ඉහත දත්ත අනුව සංයෝජන කොපමණ උත්සාහ කළ යුතු ද?

(A) 1480 (B) 3600 (C) 5400 (D) 7200 (E) 8400

24. බොරු කියන්නන්ගේ දේශයෙහි සුදු කල්ලියේ අය හැම විටම ඇත්ත කියති. රතු කල්ලියේ අය හැම විටම බොරු කියති. කළු කල්ලියේ අය එක් දිනක බොරු කියන අතර ඊළඟ දිනයේ ඇත්ත කියති. යළිත් තුන්වැනි දිනයේ බොරු කියති. මෙලෙස ඔවුන් මාරුවෙන් මාරුවට ඇත්ත/බොරු කියති. එක්කෝ සුදු කල්ලියේ නැතිනම් රතු කල්ලියේ වන නිමල්, කමල්, අබ්දුල් සහ මීනා යන හතර දෙනාගෙන් ප්‍රශ්න කළ විට පිළිතුරු දුන් ආකාරය පහත දැක්වේ:

නිමල් : "කමල් රතු කල්ලියේ"

කමල් : "අප හතර දෙනාගෙන් සුදු කල්ලියේ කෙනෙකු ඉන්නේ මා විතරයි "

අබ්දුල්: "නිමල් සහ මීනා දෙන්නාගෙන් අඩු තරමින් එක් කෙනෙකු වත් රතු කල්ලියේ"

මීනා : "අපි හැමෝම සුදු කල්ලියේ"

මේ හතර දෙනාගෙන් කී දෙනෙකු රතු කල්ලියේ අය ද?

(A) 0 (B) 1 (C) 2 (D) 3 (E) 4



25. දකුණු පසින් දැක්වෙන්නේ 'ඩොමිනෝව'කි: 

පහත රූප වලින් කවරක් හිස් කොටු නොමැති ව එක මත එක නොපිහිටන පරිදි ඩොමිනෝ වලින් ආවරණය කළ හැකි ද?

I.  ii.  iii 

(A) I පමණි (B) II පමණි (C) I සහ II පමණි
(D) I සහ III පමණි (E) සියල්ල

26. *SIMC 2009* තරඟය සඳහා සිසුන් 7777 ක් සහභාගී වෙති. ඔවුන් හැම දෙනෙකු ම ප්‍රශ්න අංක (26), (27), (28), (29) සහ (30) ට දී ඇති උපදෙස් අනුව පිළිතුරු සපයන බව උපකල්පනය කරන්න. එනම්, එක් ප්‍රතිචාරයක් පමණක් නිවැරදි යැයි ලකුණු කිරීම හෝ කිසිවක් ලකුණු නොකර සිටීම යන දෙකෙන් එකක් කරන්නේ යැයි සිතන්න. ඔබට නිගමනය කළ හැක්කේ කුමක් ද?

I. ප්‍රශ්න පහට එක හා සමාන ව පිළිතුරු සැපයූ සිසුන් පසු දෙනෙකු සිටිය හැකිය.

II. ප්‍රශ්න පහට පහත අයුරින් පිළිතුරු සැපයූ එක් අයෙකු හෝ සිටිය යුතු ය:

(26) - A (27) - B (28) - C (29) - D (30) - E

III. ප්‍රශ්න පහට එක හා සමාන ව පිළිතුරු සැපයූ සිසුන් දෙදෙනෙකු වත් සිටිය යුතුය

(A) I පමණි (B) II පමණි (C) I සහ II පමණි
(D) I සහ III පමණි (E) සියල්ල

27. ප්‍රශ්න අංක 24හි සිටි නිමල්, කමල්, අබ්දුල් සහ මීනා අතරින් යමහරක් තමන් අයත් කල්ලි වෙනස් කරගෙන ඇතැයි සිතන්න. එක්තරා දිනක ඔවුන් අතර සුදු කල්ලියේ අය කීදෙනෙකු සිටී ද යන ප්‍රශ්නය ඇසූ විටත්, මීළඟ දිනයේ ඔවුන් අතර රතු කල්ලියේ අය කීදෙනෙකු සිටී දැයි යන ප්‍රශ්නය ඇසූ විටත් ඔවුන්ගෙන් එක් එක් පුද්ගලයා ලබා දුන් පිළිතුර එක ම වේ. එම පිළිතුරු පහත දැක්වේ.

නිමල් : "හරියට ම එක් කෙනෙක්"

කමල් : "හරියට ම දෙදෙනෙක්"

අබ්දුල් : "හරියට ම තුන් දෙනෙක්"

මීනා : "හරියට ම හතර දෙනෙක්"

මේ හතර දෙනා අතර රතු කල්ලියේ අය කීදෙනෙකු සිටී ද?

(A) 0 (B) 1 (C) 2 (D) 3 (E) 4

28. ඕනෑම $n$ නම් ධන නිඛිලයක් සඳහා $f(n) = \{n$ හි එකිනෙකට වෙනස් ප්‍රථමක සාධක$\}$ යැයි සිතමු. පහත ප්‍රකාශ වලින් කුමක්/කුමන ඒවා හැම විට ම සත්‍ය වේ ද?

I. සියළු $m, n$ ධන නිඛිල සඳහා $f(mn) = f(m) \cup f(n)$

II. $f(m) = f(n) \Rightarrow m = n$

III. $P$ යනු සියළුම ප්‍රථමක සංඛ්‍යා කුලකය සහ $A \subseteq P$ නම්, $f(N) = A$ වන පරිදි $N$ නම් ධන නිඛිලයක් පවතී.

(A) I පමණි (B) II පමණි (C) III පමණි
(D) I සහ II පමණි (E) I සහ III පමණි

29. අ. නන්ත නැමැත්තා විසින් ගොඩනංවන ලද අනන්ත ක්‍රිකට් ක්‍රීඩාංගනය එක් එක් ධන නිඛිලයට අසුනක් බැගින් ඇති සර්පිලාකාර ක්‍රීඩාංගනයකි. මෙම ක්‍රීඩාංගනයෙහි $n$ වැනි අසුන රුපියල් $\frac{1}{n}$ ප්‍රමාණයකට මිල කොට තිබේ. ක්‍රිකට් තරඟයක් පැවැත්වෙන අවස්ථාවක ක්‍රීඩාංගනය පිරී ඇති විටක දී සෑම ප්‍රේක්ෂකයෙකුට ම තමාට එහා අසුනට යන ලෙස දන්වනු ලැබේ. එනම්, $n$ වැනි අසුනෙහි සිටින පුද්ගලයා $(n+1)$ වැනි අසුනෙහි හිඳගනී. මෙය සිදු කරනු ලබන්නේ අ. නන්ත හට පළමු වැනි අසුන ලබා දීමට ය. නමුත් මෙම අසුන් මාරුවේ දී $n$ වැනි අසුනෙහි සිටි තැනැත්තා හට රුපියල් $\left(\frac{1}{n}-\frac{1}{n+1}\right)$ක මුදලක් නැවත ලබාදීමට සිදුවේ. පහත කුමක්/කුමන ඒවා සත්‍ය වේද?

I. අංක 1 සිට to $10^{2009}$ දක්වා අසුන් වල සිටි සියලු දෙනාට නැවත ලබාදීම සඳහා රුපියලක් ප්‍රමාණවත් වේ.

II. අංක 1 සිට to $10^{2009}$ දක්වා අසුන් වල සිටි සියලු දෙනාට නැවත ලබාදීම සඳහා රුපියල් $\left(1-\frac{1}{10^{2009}}\right)$ක් ප්‍රමාණවත් නොවේ.

III. අංක 1 සිට to $10^{2009}$ දක්වා අසුන් වල සිටි සියලු දෙනාට නැවත ලබාදීම සඳහා රුපියල් $10^{2009}$ ක් ප්‍රමාණවත් නොවේ.

(A) I පමණි (B) II පමණි (C) III පමණි
(D) I සහ II පමණි (E) II සහ III පමණි

30. $n$ යනු පහත සමීකරණයෙහි $(x, y)$ නිඛිල විසඳුම් ගණන ලෙස සිතන්න:

$$x(x+6) = y^2 + k$$

පහත කුමක්/කුමන ඒවා සත්‍ය වේ ද?

I. $n = 0$ වන පරිදි $k$ ට නිඛිල අගයයක් දිය හැකිය.

II. ඕනෑම $m$ නම් ධන නිඛිලයක් සඳහා $n = m$ වන පරිදි $k$ ට නිඛිල අගයයක් දිය හැකිය.

III. $n$ පරිමිත නොවන පරිදි $k$ ට නිඛිල අගයයක් දිය හැකිය.

(A) I පමණි (B) II පමණි (C) III පමණි
(D) I සහ III පමණි (E) II සහ III පමණි

---

Thank you very much for your participation in the *SLMC 2009*. Your score on this competition will be posted against your index number in www.slmathsolympiad.org. The best 25 students in the *SLMC 2009* will be invited (they will be notified by mail) to participate in the *SLMCC 2009* which will be held on 28th March 2009. In this competition we have tried to showcase mathematics by posing puzzle type questions covering various areas of mathematics. Though the problems require very little knowledge, not more than a Year 10 student's basic mathematics knowledge, some problems might require the mathematical maturity of a student in a higher grade. We hope that this kind of problems will stimulate your mathematical interest beyond classroom mathematics. If you didn't do too well, don't be discouraged! You may have great mathematical talent, but it requires nurturing!! Look for opportunities - there are many websites in the internet and also good books featuring excellent mathematical problems - challenge yourself! For any comments/ suggestions:
e-mail: cjw@maths.cmb.ac.lk, sms or call: 072 3678215




**Index No:** 

**Medium** SINHALA

# SRI LANKAN MATHEMATICS COMPETITION 2009

## March 07, 2009

This question paper has **30 questions**. The duration of this competition is **90 minutes**. **Answer all questions**. Please read the questions carefully and **fill in the correct lettered circle (only one) against the correct question number in the given answer sheet**. Note that no responses get at least two points while incorrect responses receive zero points. **Please write your index number in the box provided at the top right corner of your question paper.**

**Scoring System for the Sri Lankan Mathematics Competition**

Questions 1 to 10 : 5 points for correct response, 2 points for no response, and 0 points for incorrect response.

Questions 11 to 20 : 6 points for correct response, 2 points for no response, and 0 points for incorrect response.

Questions 21 to 30 : 8 points for correct response, 3 points for no response, and 0 points for incorrect response.

**Sri Lanka Olympiad Mathematics Foundation**

$\quad E \quad F \quad G \quad H$

$\quad 2 \quad 0 \quad 0 \quad 9$

වේ. $C$ හි අගය කුමක් ද?

(A) 0 (B) 1 (C) 2 (D) 3 (E) 4

2. $10(2009)^4 + 11(2009)^3 + 12(2009)^2 + 13(2009) + 14$ යන්න 2009 න් බෙදූ විට ශේෂය වන්නේ

(A) 0 (B) 12 (C) 14 (D) 1985 (E) 2008

3. $\dfrac{2009^2 + \sqrt{2}}{10^6}$ හි හයවැනි දශම සංඛ්‍යාංකය කියද ?

(A) 0 (B) 1 (C) 2 (D) 3 (E) 4

4. කසද්පනා විසින් ප්‍රයෝජනවත් තෑගි 12 ක් නිර්මලීට දෙනු ලැබ ඇත. නිර්මලී සතු ව සාස්පාන් 10ක් ඇති අතර, ඇය සතු ව ඇලුමිනියම් භාණ්ඩ ඇත්තේ එපමණකි. නිර්මලී සතු ව ඇති එක සාස්පානකින් වත් කිසිම ප්‍රයෝජනයක් නැත. කසද්පනා විසින් නිර්මලීට දී තිබෙන තෑගි අතර ඇලුමිනියම් භාණ්ඩ කියක් තිබේ ද ?

(A) 0 (B) 2 (C) 10 (D) 12
(E) දී ඇති දත්ත මගින් නිගමනය කළ නොහැකිය.

5. $ABCD$ යනු සමචතුරශ්‍රයක් වන අතර $P$ ඒ තුළ වූ ඕනෑම ලක්ෂ්‍යයකි. $\dfrac{\text{අඳුරු කළ කොටසේ වර්ගඵලය}}{\text{අඳුරු නොකළ කොටසේ වර්ගඵලය}}$ යන අනුපාතය කුමක් ද ?




(A) $\frac{1}{3}$ (B) $\frac{1}{2}$ (C) $\frac{1}{1}$ (D) $\frac{2}{1}$
(E) $P$ හි පිහිටීම නිශ්චිත ව නොදැන හර්ණය කළ නොහැකිය.



එකිනෙකට ලං වන පරිදි ප්‍රතිවිරුද්ධ දිශා වලට ගමන් අරඹයි. මෝටර් රථ දෙක $15ms^{-1}$ සහ $25ms^{-1}$ නියත වේග වලින් ගමන් කරන්නේ නම්, ඔවුන් එකිනෙකා පසු කර යන්නේ තත්පර කියකට පසුව ද?

(A) 40 (B) 35 (C) 30 (D) 25 (E) 20

7. $A$ සහ $B$ මෝටර් රථ දෙකක් නියත වේග වලින් සෘජු සමාන්තර මාර්ග දෙකක් ඔස්සේ, එකිනෙකට ලං වන පරිදි ප්‍රතිවිරුද්ධ දිශා වලට ගමන් කරයි. $A$ හි වේගය $30ms^{-1}$ වේ. $P$ නම් පහන් කණුවක් මාර්ග දෙක අතර පිහිටන්නේ රූපයේ පෙන්වා ඇති අයුරින්, $QP:PS=1:2$ වන පරිද්දෙනි. $B$ ගමනේ යෙදෙන්නේ $B$, $P$ සහ $A$ හැම විට ම සරල රේඛාවක පිහිටන පරිදි නම් $B$ හි වේගය කොපමණ වේ ද ?




(A) $15ms^{-1}$ (B) $30ms^{-1}$ (C) $45ms^{-1}$ (D) $60ms^{-1}$ (E) $90ms^{-1}$

8. $k$ යනු ඕනෑම අනුයාත ධන නිඛිල 41 ක ගුණිතය යැයි සිතමු. පහත කුමක්/කුමන ඒවා හැම විට ම සත්‍ය වේ ද?
I. 2 න් $k$ බෙදනු ලබයි II. 3 න් $k$ බෙදනු ලබයි III. 2009 න් $k$ බෙදනු ලබයි

(A) I පමණි (B) II පමණි (C) III පමණි (D) I සහ II පමණි (E) සියල්ල

9. පහත සමීකරණ පද්ධතියේ $x_5$ හි අගය සොයන්න:

$$x_1 + x_5 + x_9 = 234$$
$$x_4 + x_5 + x_6 = 234$$
$$x_7 + x_5 + x_3 = 234$$
$$x_1 + x_4 + x_7 = 234$$
$$x_9 + x_6 + x_3 = 234$$

(A) 60 (B) 78 (C) 96 (D) 117 (E) 468

10. පහත දැක්වා ඇති ඝනකයෙහි $A, B, C, D, E$ යනු ශීර්ෂ වන අතර $P$ යනු $BP:PC = 1:3$ . වන පරිදි $BC$ මත පිහිටි ලක්ෂ්‍යයකි. $A$, $E$ සහ $P$ හරහා යන තලය විසින් ඝනකය කොටස් දෙකකට බෙදනු ලබයි. $\dfrac{\text{කුඩා කොටසේ පරිමාව}}{\text{විශාල කොටසේ පරිමාව}}$ යන අනුපාතය කුමක්ද?




(A) $\frac{1}{8}$ (B) $\frac{1}{7}$ (C) $\frac{1}{6}$ (D) $\frac{1}{5}$ (E) $\frac{1}{4}$

11. ඉංග්‍රීසි භාෂාවෙන් ලියන ලද පණිවුඩයක් කේතනය කොට යාදාගත් පහත දැක්වෙන සතුරු පණිවුඩය හසු කර ගත් අතර එහි "ATTACK" (පහර දෙනු) යන වචනය ඇතුලත් විය. එය අවසන් වන්නේ යුධ නායකයෙකුගේ අන්වර්ථ නාමය වන "NEM" යන්නෙන් බව ද අනාවරණය විය. එලෙසින් හොඳ කේතනය කරන ලද පණිවුඩයේ එක එකිනෙකට වෙනස් අකුරු මගින්, මුල් පණිවුඩයෙහි එක එකිනෙකට වෙනස් ඉංග්‍රීසි අකුරු නිරූපණය වන බව ද දැනගන්නා ලදී. ප්‍රහාරය එල්ල කරන වේලාව කුමක් ද ?

*DWWDFNDWWHQDPXVHVXLFLGHFDGHUQHP*

(A) 6.00 a.m. (B) 7.00 a.m. (C) 7.00 p.m.
(D) 10.00 a.m. (E) 10.00 p.m.

12. නොඅඹුරු ඝනක දෙකක මුහුණත් එක්කෝ රතු පාටින් නැත්නම් නිල් පාටින් පාට කර තිබේ. පළමු ඝනකයෙහි රතු මුහුණත් පහක් සහ එක් නිල් මුහුණතක් ඇත. මෙම ඝනක දෙක පෙරලූ විට ඝනක දෙකේ ම ඉහළ මුහුණත් එකම පැහැය ගැනිමේ සම්භාවිතාව $\frac{1}{2}$ කි. දෙවැනි ඝනකයෙහි රතු පැහැති මුහුණත් කියක් තිබේද ?

(A) 1 (B) 2 (C) 3 (D) 4 (E) 5

13. $a_1a_2a_3a_4$ යනු $a_1 + 2a_2 + a_3 = 20$ සහ $a_2 \times a_4 = 10$ වන පරිදි වූ සංඛ්‍යාංක හතරක ධන නිඛිලයකි. $a_1 + a_2 + a_3 + a_4$ ට ගත හැකි අවම අගය වන්නේ

(A) 12 (B) 13 (C) 15 (D) 17 (E) 19

14. එක්තරා සුන්දර පොකුණක 100 සිට 150 අතර සංඛ්‍යාවක් වන ගෙඹි ගහණයක් තිබිණ. එක් අභාග්‍ය සම්පන්න ඉරු දිනක කොහෙන්දෝ පැමිණි රාක්ෂ කොකෙක් අසරණ ගෙම්බන් තම භෝජනය කර ගත්තේය. මින් පසු හැම ඉරු දිනක ම මෙම කොකා පොකුණ කරා පැමිණියේය. ඒ හැම අවස්ථාවක ම ඔහු ගෙම්බන් සමාන සංඛ්‍යාවක් ආහාර කොට ගත් අතර පැමිණීම් දෙකක් අතර දී ගෙම්බන් සංඛ්‍යාව තුන් ගුණයකින් වැඩි විය. 4 වැනි වතාවේ ඔහු පොකුණේ සිටි සියලු ම ගෙම්බන් ගිල දැම්මේ නම්, ඔහුගේ පළමු පැමිණීමේ දී සිටි ගෙම්බන් සංඛ්‍යාවේ සංඛ්‍යාංක වල එකතුව කුමක් ද?

(A) 1 (B) 2 (C) 3 (D) 4 (E) 5

15. සුදොකු ගැටලුවක දී කොටු $9 \times 9$ සහිත ජාලය 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 යන නිඛිල වලින් පිරවිය යුත්තේ සෑම ජේළියක ම, සෑම තීරුවක ම සහ සෑම පෙන්වා ඇති කොටු $3 \times 3$ ජාලයක ම එක් සංඛ්‍යාවක් හරියට ම එක් වරක් පමණක් ඇතුලත් වන පරිද්දෙනි. අඳුරු කර ඇති කොටු වලට එන සංඛ්‍යා වල එකතුවේ සංඛ්‍යාංක වල එකතුව කුමක් ද?

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | 7 | 3 | | | |
| 2 | 3 | | | | 8 | | | |
| | | 4 | | | | 1 | 9 | |
| | | 7 | 5 | | | | 1 | |
| | | | | | | | | |
| | 8 | | | | 1 | 9 | | |
| | 5 | 6 | | | | 7 | | |
| | | | 4 | | | | 8 | 2 |
| | | | 6 | 9 | | | | 1 |

(A) 5 (B) 6 (C) 7
(D) 8 (E) 11

16. $x_1, x_2, \ldots$ අනුක්‍රමය පහත පරිදි අර්ථ දක්වා ඇත:
$x_1 = 1, x_2 = 2, x_3 = 3, x_4 = x_5 = x_6 = 4, x_7 = x_8 = x_9 = 5, x_n = x_{k+1}$, මෙහි $n \geq 10$ සහ $n = 10l + k,\ 0 \leq k < 10$ වේ. $x_{2009}$ සොයන්න.

(A) 1 (B) 2 (C) 3 (D) 4 (E) 5



17. $ABC$ සමපාද ත්‍රිකෝණයක් වන අතර $P, Q, R$ යනු $AP : PB = BQ : QC = CR : RA = 1 : 3$ වන පරිදි $AB$, $BC$, $CA$ මත පිහිටි ලක්ෂ්‍ය වේ. $\frac{[ABC]}{[PQR]}$ අනුපාතය කුමක්ද? $[ABC]$ යනු $ABC$ ත්‍රිකෝණයේ වර්ගඵලයයි.

(A) $\frac{2}{1}$ (B) $\frac{8}{3}$ (C) $\frac{16}{7}$ (D) $\frac{4}{3}$ (E) $\frac{8}{5}$

18. ධන පරිමේය සංඛ්‍යා පුනරාවර්තන කිහිපයක් සහිත ව දකුණු පසින් දැක්වෙන පරිදි, ඊතල ඔස්සේ යමින් ලියා දැක්විය හැකිය.



මෙම ලැයිස්තුවෙහි 100 වැනි පරිමේය සංඛ්‍යාව කුමක් ද?

(A) $\frac{1}{2}$ (B) $\frac{8}{7}$ (C) $\frac{4}{3}$ (D) $\frac{3}{2}$ (E) $\frac{11}{5}$

19. පහත 'සාධනය' සලකන්න:

පියවර 1: ධන නිඛිල කුලකයේ විශාලතම නිඛිලයක් ඇතැයි සිතමු. $n$ යනු විශාලතම ධන නිඛිලය ලෙස ගනිමු.
පියවර 2: එනයින් $n \geq 1$ වේ.
පියවර 3: නමුත් $n \geq n^2$ වේ.
පියවර 4: එමනිසා $1 \geq n$ වේ.
පියවර 5: එබැවින් $n \geq 1$ සහ $n \leq 1$ වේ. එමනිසා $n = 1$ වේ. !

ඔබට නිගමනය කළ හැක්කේ කුමක් ද?
I. පියවර 2 වැරදිය.
II. පියවර 3 වැරදිය.
III. පියවර 4 වැරදිය.

(A) I පමණි (B) II පමණි
(C) III පමණි (D) I සහ II පමණි
(E) ඉහත කිසිවක් නො වේ.

20. දකුණු පස දැක්වෙන දීර්ඝ බෙදීමෙහි තරු වලින් ඕනෑම සංඛ්‍යාංකයක් ද, එකිනෙකට වෙනස් අකුරු වලින් එකිනෙකට වෙනස් සංඛ්‍යාංක ද නිරූපණය වන බව සලකන්න. ලබ්ධියෙහි ඇති තිත දශම තිතයි. භාජකය (බෙදනු ලබන්නේ කුමකින් ද යන්න) සොයන්න.




(A) 10 (B) 20 (C) 16
(D) 40 (E) 80